# බුදු දහමෙන් පෙන්වා දෙන මදයට හා ප්‍රමාදයට හේතු වන මත්ද්‍රව්‍ය භාවිතයේ ආදීනව පිළිබඳ සූත්‍ර පිටකය ඇසුරෙන් සිදුකරන ලද අධ්‍යයනයක්

**හල්මිල්ලෑවේ සුවච හිමි**[1]

**හැඳින්වීම**

වර්තමාන සමාජයේ බහුලව සාකච්ඡා වන ප්‍රශ්නයක් ලෙස මත්ද්‍රව්‍ය උවදුර හඳුනාගත හැකි ය. පෙර අපර දෙදිග බොහෝ විද්වතුන් මත්ද්‍රව්‍ය භාවිතයෙහි අනිසි ප්‍රතිඵල පිළිබඳ ව පර්යේෂණයට බඳුන් කොට ඇති නමුත් මෙහි දී මදයට හා ප්‍රමාදයට හේතු වන මත්ද්‍රව්‍ය භාවිතයේ ආදීනව පිළිබඳ බෞද්ධ සූත්‍ර පිටකය ඇසුරෙන් සාකච්ඡාවට බඳුන් කරනු ලැබේ. එයට ප්‍රධානතම හේතුව වන්නේ වර්තමානය සමාජය තුළ සීඝ්‍රයෙන් මෙම මත්ද්‍රව්‍ය උවදුර පැතිර යාමයි. එම නිසා පුද්ගලයා ලෞකික වශයෙන් මෙන් ම ආධ්‍යාත්මික වශයෙන් ද පරිහානියට පත්ව ඇත. පුද්ගලයා එම ආදීනවයන්ගෙන් මිදී ලෞකික හා ආධ්‍යාත්මික දියුණුව ඇති කරගන්නා ආකාරය  මෙහි දී සූත්‍ර පිටකය ඇසුරින්  පර්යේෂණයට බඳුන් කොට ඇත.

**පර්යේෂණ ක්‍රමවේදය**

බෞද්ධ ඉගැන්වීම්වලට අනුව මදයට හා ප්‍රමාදයට හේතුවන මත්ද්‍රව්‍ය භාවිතයෙහි ආදීනව මොනවාද යන මාතෘකාව මූලික කරගෙන ගුණාත්මක විධික්‍රමය යටතේ සාහිත්‍ය පරිශීලනයෙන් මෙම පර්යේෂණය සිදු කරනු ලැබේ.

**සාකච්ඡාව**

මත්ද්‍රව්‍ය භාවිතය හා මත් වතුර පානය කිරීම ලාංකීය සමාජයේ පමණක් නොව සමස්ත ලෝකය ම බිලිගන්නා රාක්ෂයකුගේ තැනට පත්ව ඇති බව මනාව පැහැදිලි වේ. එය වර්තමානයේ සමාජ ප්‍රශ්නයක් බවට පත්ව ඇති අතර මත්ද්‍රව්‍ය උවදුර වලක්වා ගැනීම සඳහා අප උත්සහ කළ යුතුවේ. එහි දී විශේෂ වශයෙන් මෙම මත්ද්‍රව්‍ය උවදුර නිවාරණය කර ගැනීම සඳහා බෞද්ධ ඉගැන්වීම් උපයෝගී කරගත හැකි වේ.

බෞද්ධ සමාජ ආචාර ධර්ම පද්ධතියේ මූලික පදනම වන්නේ පංචසීලයයි. එම පංචශීලයෙහි සඳහන් වැළකී සිටිය යුතු කාරණා පහෙන් අවසාන සිල් පදය වන්නේ මදයට හා ප්‍රමාදයට හේතුවන මත් වතුර පානයෙන් වැළකීම යන්නයි. සුරාමේරය මජ්ජපමාදට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි පංචසීල ප්‍රතිපත්තිය ශිෂ්ටාචාර සම්පන්න සමාජයේ මූලික ලක්ෂණය වන බැවින් මිනිසා මතින් තොරවීම ශිෂ්ටත්වයේ

1. බෞද්ධ අධ්‍යයන පීඨය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය. halmillewesuwacha@gmail.com

අංග ලක්ෂණයක් වශයෙන් බුදුරජාණන් වහන්සේ සැලකූ බව මින් පැහැදිලි වේ. රහමෙර පානය නිසා මදය හා ප්‍රමාදය ඇතිවන බව එම ශික්ෂා පදය තුළ අන්තර්ගත වේ. මදය යනු ප්‍රකෘති සිහියෙන් තොරවීමය. උන්මත්තයකුසේ ක්‍රියාකිරීම. හරි වැරදි තෝරා බේරාගෙන ක්‍රියා කළ හැකි සිත උවමනාවෙන් ම උමතුභාවයට පත්කර ගැනීම අකුසල් පුරවා ගැනීමට මග සලසන්නක් බව බුදුරජාණන් වහන්සේගේ දේශනාව තුළ සඳහන් වේ. ප්‍රමාදය යන පදය බුදුදහමේ පුළුල් අරුතකින් භාවිතා වන්නකි. ප්‍රමාදය පිළිබඳ ව ධම්මපදයෙහි අප්පමාද වග්ගය යනුවෙන් වෙනම ම වග්ගයක් වෙන් කොට ඇත. කුසලය හෙවත් සසර දුකින් මිදීමේ මඟ ප්‍රමාද කරවමින් දස අකුසලයට පුද්ගලයා යොමු වන්නේ ප්‍රමාදය නිසා ය. කෙනෙකු සුරාව පානය කිරීම තුළින් ද ඇතිවන්නේ එම ප්‍රමාදයයි. ප්‍රමාදය මාරයාගේ කරුණකිග "පමාදෝ මච්චුනෝ පදං" ආදී වශයෙන් ප්‍රමාද වීම පිළිබඳ ඉගැන්වීම් රාශියක් ධම්මපදයේ අප්පමාද වග්ගේ විස්තර වෙයි. සුරා පානය ඉහත කී පරිදි සිහිය විකෘති කිරීම නිසාත් අකුසලයට පුද්ගලයා ඇද දමන නිසාත් එය අත්හළ යුතු ක්‍රියාවක් බව බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන්හ. "සුරාමේරය මජ්ජපමා දට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි" යන ශික්ෂාපදය තුළින් මත් වතුර බීමට පමණක් සීමා වන්නේ නැත. මත්වීමට හා ප්‍රමාදයට හේතුවන සෑම වර්ගයේ ම මත්ද්‍රව්‍ය භාවිතා කිරීම මෙයට අයත් ය.

එසේ ම මත්ද්‍රව්‍ය භාවිතයෙහි අනිසි ප්‍රතිඵල පිළිබඳ වත් එසේ ම මත්ද්‍රව්‍ය භාවිතය මිනිසා අකුසලයට ඇද දමන ආකාරයත් පිළිබඳ ව බොහෝ කරුණු කාරණා සඳහන් සූත්‍ර දේශනාවක් ලෙස සිඟාලෝවාද සූත්‍රය හැඳින්විය හැකි ය. සිඟාලෝවාද සූත්‍රය තුළ සම්පත් විනාශ වන දොරටුවක් වශයෙන් පෙන්වා දෙන රහ මෙර භාවිතය [සුරාමේරය මජ්ජපමා දට්ඨානානු යෝගෝ] නිසා පහත සඳහන් පරිදි ආදීනව පහක් අත්විඳීමට සිදු වන බව පෙන්වා දී තිබේ.

- ධනය විනාශ වීම
- අරගලවලට පැටලීම
- අපකීර්තියට පත්වීම
- රෝගියෙකු වීම
- නුවණ දුර්වල වීම

තව ද බුදු දහමේ මත්ද්‍රව්‍ය නිසා පුද්ගලයා සහ පුද්ගලයා සතු ධනය පරිහානියට පත්වීම සම්බන්ධයෙන් දේශනා කොට ඇති සූත්‍ර දේශනාවක් වශයෙන් ව්‍යග්ගපජ්ජ සූත්‍රය මෙහි දී සඳහන් කළ හැකි ය. එහි වැඩිදුරටත් පෙන්වා දී ඇත්තේ මහත් වූ විලක් ඇති බවත් එහි ජලය ඇතුළුවන මාර්ග සතරකිග ජලය පිටවන මාර්ග සතරකි. පුද්ගලයා සතු සම්පත් විල නම් ධනෝපායන මාර්ග ජලය ඇතුළු වන මාර්ග ලෙස නම් කළ හැකි ය. මෙම විලෙහි ජලය පිටවන මාර්ග සතර ලෙස අපාය මුඛ හෙවත් වැරදි චර්යාවන් සතරක් පෙන්වා දෙයි. යම් කෙනෙකු මෙම විලෙන් ජලය පිටවන මාර්ග සතර වසා නොතැබුවහොත් විලට එකතු වන ජලය රැඳෙන්නේ නැතිව විල හිස් වන්නේය. එසේ ම පුද්ගලයෙකු තමාගේ ධන විනාශ මුඛ සතර වසා නොතැබුවහොත් ඔහු සතු ධනය විනාශ වී ජලය හිස් වූ විලමෙන් ධනයෙන් පිරිහුණ පුද්ගලයකු බවට පත්වන බව බුදුරජාණන් වහන්සේ ව්‍යග්ගපජ්ජ සූත්‍රයේ දේශනා කොට ඇත.

තව ද ධනය විනාශ වන ක්‍රම හයක් පිළිබඳ ව බුදුරජාණන් වහන්සේ සිඟාලෝවාද සූත්‍රයේ දී ද පෙන්වා දී ඇත. යම් පුද්ගලයෙකු සතුව එම දුබලතා එකක් හෝ ඇත්නම් ඔහු සතු ධනය විනාශ වී දිලින්දෙකු බවට පත්වෙන බව බුදුරජාණන් වහන්සේ ඉතා පැහැදිලිව සිඟාලෝවාද සූත්‍ර දේශනාවේදී දේශනා කොට ඇති බව එම සූත්‍ර අධ්‍යයනයේ දී පෙනී යයි. එහි සඳහන් වන මත්ද්‍රව්‍ය පාවිච්චි කිරීම ගත් කළ මත්ද්‍රව්‍ය පුද්ගලයාගේ කායික හා මානසික සුවය විනාශ කරන බව පැහැදිලි වෙයි. යම් පුද්ගලයකු මත්ද්‍රව්‍ය පාවිච්චි කරයි නම්, ඔහුට පරිහානි හයකට මුහුණ පෑමට සිදුවන බව සිඟාලෝවාද සූත්‍රයේ වැඩිදුරටත් බුදුරජාණන් වහන්සේ සිඟාල ගෘහපතියාට පෙන්වා දී ඇත.

සිඟාලෝවාද සූත්‍රයේ සඳහන් වන්නේ මත්ද්‍රව්‍ය පාවිච්චි කරන්නාට ඒ කාරණාවන් හයට මුහුණදීමට සිදුවන බව යි. මේ කාරණාවලින් වැළකී සිටීම තුළින් අපට යහපත් සෞඛ්‍යමය නිරෝගිමත් ජීවිතයක් ගත කරන්නට පුළුවන්කම ලැබෙනු ඇත.

තවදුරටත් බුද්ධ දේශනාව තුළ අඩංගු සූත්‍ර දේශනාවක් ලෙස පුද්ගලයකු පරිහානියට පත්වන කරුණු දේශනා කරන ලද පරාභව සූත්‍රයේ සඳහන් වන පහත පාඨය සඳහන් කළ හැකි ය.

ඉත්ථි ධුත්තෝ සුරාධුත්තෝ - අක්ක ධුත්තෝ ච යෝ නරෝ

ලද්දං ලද්දං විනාසේති - තං පරාභවතෝ මුඛං

ඉහත සඳහන් කරන්නට යෙදුන සූත්‍ර දේශනාවල මෙන් ම සුරාවට ලොල්ව ඉතා දරුණු පාප කර්මවලට පෙලඹුණු අය පිළිබඳ ව ද ජාතක කථාවලින් අසන්නට ලැබේ. ධර්මද්වජ ජාතකයේ එන තොරතුරකට අනුව ඡත්තපාණි නම් කපුවා සුරාවෙන් මත්ව තම පුත්‍රයා මරා මාංශ අනුභව කළේ ය. තුණ්ඩිල ජාතකයේ එන පරිදි එක්තරා මැහැල්ලක් පුත්‍ර ප්‍රේමයෙන් හදා වඩාගත් ඌරු පැටවා මිල ගෙවා ඉල්ලා සිටි සුරා සොඬුන්ට විකිණීම තරයේ ප්‍රතික්ෂේප කරයි. එහෙත් සුරා සොඬහු ඇයට මත් වතුර පොවා සිහි විකල් වූ පසු ඌරු පැටවා මස් පිණිස විකිණීමට එකඟ කරවා ගනිති. එසේ ම සුරාවෙන් මත් වීමෙන් මිනිසා තිරිසනකුගේ තත්ත්වයට පත්වෙන බව සුරාපාන ජාතකයෙන් පැවසෙයි. මෙම ජාතක කතා අධ්‍යයනය තුළින් අපට පෙනී යන්නේ මේ මත්ද්‍රව්‍ය කොතෙකුත් දුරට පුද්ගලයා විකෘති සිහි ඇත්තන් බවට පත් කරන්නේ ද මොනතරම් මත් වතුර පානය කරන්නා අබල දුබල වූ තත්ත්වයට පත් කරන්නේ ද යන්න පිළිබඳ ව යි.

බෞද්ධ කර්ම විපාක ඉගැන්වීම්වලට අනුව මත්ද්‍රව්‍ය පානය කිරීම සහ වෙළඳාම් කිරීම අකුසල කර්මයකි. විශේෂ වශයෙන් බුදුරජාණන් වහන්සේ වණිජ්ජා සූත්‍රයේ දී පුද්ගලයා විසින් නොකළ යුතු වෙළෙඳාම් කිහපයක් දේශනා කර ඇත. එම දේශනාවේ තවදුරටත් සඳහන් වන්නේ මෙවැනි වෙළෙඳාම් සිදුකොට උපයා සපයා ගන්නා වූ ධනය තාවකාලික ධනයක් බව යි. කුමන හෝ වේලාවකදී මේ ධනය සහ තමන් විනාශ භාවයට පත් වෙන්නට ඉඩ ඇති බව බුදුරජාණන් වහන්සේ තවදුරටත් වදාළ සේක. එබැවින් මෙලොව වශයෙන් ඔවුන්ගේ අතමිට සරුව සෞභාග්‍ය සම්පන්න භාවයක් පෙනෙන්නට තිබුණු නමුත් පරලොව දී නිරාදුක් විඳීමට සහ මිනිසත් බවක් ලැබුවද විවිධ දුක් පීඩා කරදර කම්කටොළුවලට මුහුණ දීමට සිදුවන බව බුද්ධ දේශනාව තුළ සඳහන් වේ. ඒ බව දිනපතා අසන්නට දකින්නට ලැබෙන බොහෝ ඛේදවාචකයන්

තුළින් අපට මනාව පැහැදිලි වෙයි. එලෙස මදයට හා ප්‍රමාදයට හේතුවන මත්ද්‍රව්‍ය පානයෙහි ආදීනව පිළිබඳ ව බොහෝ කරුණු බුද්ධ දේශනාවන් තුළ අඩංගු වේ.

**නිගමනය**

වර්තමානයේ සමාජ ප්‍රශ්නයක් බවට පත්ව ඇති මදයට හා ප්‍රමාදයට හේතු වන මත්ද්‍රව්‍ය භාවිතය සමාජය තුළින් තුරන් කිරීම සඳහා අපට බුදුරජාණන් වහන්සේගේ බුද්ධ දේශනාවන් සෘජුව ම උකහා ගත හැකි වේ. බුද්ධ දේශනාව තුළ නොයෙක් ආකාරයෙන් මෙම මත්ද්‍රව්‍ය උවදුර නිරාකරණය කර ගැනීමට අවශ්‍ය මඟ පෙන්වීම් සහ මත්ද්‍රව්‍ය භාවිතය නිසාවෙන් ඇතිවන්නා වූ කායික මානසික සහ සමාජමය වශයෙන් පුද්ගලයන්ට ඇතිවන්නා වූ ගැටලුකාරී තත්වයන් බුද්ධ දේශනාවන් තුළ සඳහන් වේ. එම කරුණු විමසා බැලීම තුළින් අවසන් වශයෙන් නිගමනයකට එළඹිය හැකි වන්නේ මදයට හා ප්‍රමාදයට හේතුවන මත් ද්‍රව්‍ය භාවිතය අවම කර ගැනීම සඳහා බුද්ධ දේශනාවන් සෘජුවම උපයෝගී කරගත හැකි බව යි.

**මුඛ්‍ය පදඃ** පරිහානිය, ප්‍රමාදය, මත්ද්‍රව්‍ය, මදය

**ආශ්‍රිත ග්‍රන්ථ**

*අංගුත්තර නිකාය,* ව්‍යග්ගපජ්ජ සූත්‍රය, (2005). බුද්ධ ජයන්ති මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*ඛුද්දක නිකාය,* පරාභව සූත්‍රය, (2005). බුද්ධ ජයන්ති මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*දීඝ නිකාය,* සිගාල සූතය, (2005). බුද්ධ ජයන්ති මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

ධර්මප්‍රිය, ජේ.ඩී. (2001). *මත්ද්‍රව්‍ය සහ සමාජය,* වරකාපොලඃ ආරිය ප්‍රකාශකයෝ.